# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1979 අංක 37 දරන අධිකරණ සංවිධාන (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1979 ජූනි මස 5 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1979 ජූනි මස 15 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැක

මිල: ශත 45 යි     තැපැල් ගාස්තුව: ශත 25 යි

# 1979 අංක 37 දරන අධිකරණ සංවිධාන (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1979 ජූනි මස 5 වන දින]

එල්. ඩී.—ඕ. 20/79.

**1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1979 අංක 37 දරන අධිකරණ සංවිධාන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. *ලුහුඬු නාමය.*

2. මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතෙහි 23 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :— *1978 අංක 2 දරන පනතේ 23 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.*

"අභියාචන. 23. දිසා අධිකරණයක් විසින් ප්‍රකාශ කරනු ලැබූ යම් නඩු තීන්දුවකින්, තීන්දු ප්‍රකාශයකින් හෝ ආඥාවකින් අතෘප්තියට පත් යම් පාර්ශ්ව කරුවකු විසින්, ඒ අධිකරණය අතින් සිදුවී ඇති නීතිය හෝ සිද්ධිය පිළිබඳ දෝෂයක් මත ඒ නඩු තීන්දුවට, තීන්දු ප්‍රකාශයට හෝ ආඥාවට විරුද්ධව අභියාචනයක් (එවැනි අභියාචනයක් සඳහා වූ අයිතිය ප්‍රකාශිතව ම අහිමිකර තිබේන විටක හැර) අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් කළ හැකි ය. එහෙත්, ඒ නඩු තීන්දුව, තීන්දු ප්‍රකාශය හෝ ආඥාව ක්‍රියාත්මක කිරීම නතර කිරීමේ ආඥාවක් ඒ දිසා විනිශ්චයකාරවරයා විසින් කරනු ලැබුව හොත් මිස, ඒ නඩු තීන්දුව, තීන්දු ප්‍රකාශය හෝ ආඥාව ක්‍රියාත්මක කිරීම නතර කිරීමේ බලපෑමක් ඒ අභියාචනය නිසා ඇති නොවිය යුතුය. තවද එසේ ඒ ක්‍රියාත්මක කිරීම නතර කිරීමේ ආඥාවක් දිසා විනිශ්චයකාර වරයා විසින් කරනු ලබන්නේ නම්, අභියාචක පාර්ශ්වකරුට නියම කරනු ලැබූ විට පැමිණ පෙනී සිටින බවටත් අභියාචනය මත අභියාචනාධිකර ණය විසින් දෙනු ලබන තීන්දුව පිළිපදින බවටත් වූ බැඳුම්කරයකට, අවශ්‍යයයි දිසා විනිශ්චයකාර වරයා විසින් සලකනු ලබන පරිදි ඇපකරුවන් ඇතිව හෝ නැතිව හෝ, අභියාචක පාර්ශ්වකරු විසින් එළඹිය යුතුය.".

3. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 26 වන වගන්තියෙහි අවසානයට පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— *ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය සංශෝධනය කිරීම.*

"(5) පවුල් අධිකරණයකට (1) වන උපවගන්තිය යටතේ පවුල් උපදේශකයකු අනුයුක්ත කරනු ලබන තුරු, එවැනි අධිකරණයක පවරනු ලබන යම් නඩු කටයුත්තක දී මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන අදාළ නොවිය යුතු ය;

ජ 41417—12,900 (79/05)

එසේ වුව ද, පරීක්ෂණය හෝ නඩු විභාගය ආරම්භ කරන ලද අවස්ථාවේ දී ඒ පවුල් අධිකරණයට පවුල් උපදේශකයකු අනුයුක්ත කර නොතිබුණ අවස්ථාවක, පවුල් උපදේශකයකු අනුයුක්ත කරනු ලැබුවේ වුව ද පවුල් උපදේශක වෙත යොමු කිරීමක් නොකර පරීක්ෂණය හෝ නඩු විභාගය අවසාන තබු තීන්දුව දක්වා පවත්වා ගෙන යනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ:—

"පවුල් අධිකරණවල කාර්ය පරිපාටිය.

29. (1) පවුල් අධිකරණයක සියලු නඩු කටයුතු, නියම කරනු ලැබිය හැකි යම් නියෝගවලට අනුකූලව පැවරිය යුතු අතර හැකි තාක් ඉක්මණින් ඒ නඩු කටයුතු පැවැත්විය යුතු ය:

එසේ වුව ද එවැනි නියෝග එසේ නියම කරනු ලබන තුරු අධිකරණය විසින් සිවිල් නඩු විධාන සංග්‍රහයේ ලඝු කාර්ය පටිපාටියට අදාළ විධිවිධාන හැකි තාක් දුරට අනුගමනය කළ යුතු ය.

(2) ළමයින් දරුකමට හදා ගැනීමේ ආඥාපනත සහ නඩත්තු ආඥාපනත යන ආඥාපනත් යටතේ නඩු කටයුතු පැවරීම සහ නඩු කටයුතු පවත්වා ගෙන යාම සම්බන්ධයෙන් බලපවත්නා, ඒ ආඥාපනත්වල ඇති විධිවිධාන, පවුල් අධිකරණවල පවරනු ලබන එවැනි නඩු කටයුතු සම්බන්ධයෙන් අදාළ වන සේ සැලකිය යුතු ය.

(3) සෑම පවුල් අධිකරණයක ම බාලවයස්කාර ළමයින්ගේ රැකවරණය සහ භාරය සඳහා වන සියලු ඉල්ලීම්වලට අන් සියලු කාරණා අභිභවා ප්‍රමුඛත්වය දිය යුතු අතර, ඒවා එදිනෙදා විභාග නොකිරීමට විශේෂ අවස්ථාගත කරුණු ඇති වුවහොත් මිස, ඒ ඉල්ලීම් පිළිබඳ කටයුතු අප්‍රමාදව අවසාන වන බවට වගබලා ගැනීම පිණිස, ඒවා පිළිබඳ විභාග එදිනෙදා ම පැවැත්විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය පහත දැක්වෙන ආකාරයට මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(අ) අංක 1 අත් හැරීමෙන්;

(ආ) අංක 2, 3 සහ 4 පිළිවෙලින් අංක 1, 2 සහ 3 ලෙස නැවත අංක කිරීමෙන්; සහ

(ඇ) නැවත අංක කරන ලද අංක 3 වෙනුවට පහත දැක්වෙන අලුත් අංකය ආදේශ කිරීමෙන්:—

"3. ඉහත අංක 1 යටතේ විස්තර කර ඇති වැරදි කිරීමට අනුබල දීම සඳහා හෝ ඒ වැරදි කිරීම සඳහා හෝ අනුබල දීම හා කුමන්ත්‍රණය කිරීම සහ ඉහත අංක 2 යටතේ විස්තර කර ඇති වැරදි කිරීම සඳහා කුමන්ත්‍රණය කිරීම.".

6. ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනය පහත දැක්වෙන ආකාරයට මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනය සංශෝධනය කිරීම.

(අ) "(116 වන අධිකාරය වූ) විදේශීය විවාහ ආඥාපනත" යන කරුණට ඉක්බිතිව ම පහත දැක්වෙන කරුණ ඇතුළත් කිරීමෙන් :—

"(58 වන අධිකාරය වූ) යාපනයේ වෛවාහික අයිතිවාසිකම් සහ උරුමකම් පිළිබඳ ආඥාපනත." සහ

(ආ) "(112 වන අධිකාරය වූ) විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනත" යන කරුණට ඉක්බිතිව ම පහත දැක්වෙන කරුණ ඇතුළත් කිරීමෙන් :—

"(56 වන අධිකාරය වන) විවාහක ස්ත්‍රීන්ගේ දේපළ පිළිබඳ ආඥාපනත.".